Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව සබරගමුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංගකලාව

තුන්වන වාරය - ඔක්තෝම්බර් - 3 වන සතිය

09 ශ්‍රේණිය

සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය

**සති පාසල 19**

**<u>තොරතුරු පත්‍රිකාව</u>**

<u>ගයමින් රඟමු.</u>

ගායනා විවිධ ආකාරයෙන් වෙති. එසේ ගායනා ඉදිරිපත් කිරීමේදී චිත්තරූප මැවෙන අයුරින් ගැයෙන කවි ගී උපයෝගී කොටගෙන රංගන අවස්ථා නිර්මාණය කළ හැකිය. ඒ ඒ කවි ගී සඳහා ආවේණික නාදමාලා ඇත. ඒ ගී එකිනෙකට යොදා ගන්නා සංගීතය ද විවිධාකාර වන අතර භාවිත කරන සංගීත භාණ්ඩ ද වෙනස් වේ. රංගන අවස්ථා සඳහා තෝරා ගන්නා කවි, ගී, විරිඳු, ශ්‍රව්‍ය - දෘශ්‍ය දෙයාකාරයෙන්ම රස විඳීමට හැකි ඒවා විය යුතුය. මෙම ගායනා භාවාත්මක ව මෙන්ම නාට්‍යෝචිත ව ගායනා කළ යුතුය.

<u>අභ්‍යාසය</u>

තොරතුරු පත්‍රිකාව ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ජන කවි යනු කුමක්දැයි හඳුන්වන්න.
2. ඔබ දන්නා ජන කවි වර්ග 5 ක් නම් කරන්න.
3. එම වර්ග 5 ට අයත් ජන කවි පෙළ ගස්වන්න .
4. ඔබ කැමති ජන කවි කීපයක් තෝරා එයට ගැලපෙන රංගනයන් නිර්මාණය කරන්න.
5. ඔබ දන්නා විරිඳු , නූර්ති ගීත, ශාන්ති කර්ම ගීත එකතු කොට පොත් පිංචක් සකස් කරන්න.